ප්‍රවෘත්තියට සෘජුව අදාළ නොවන්නේ නම්, යම් අයෙකුගේ/අයවලුන්ගේ වාර්ගිකත්වය හෝ ආගමිකත්වය සඳහන් නොකළ යුතු බව, මාධ්‍ය ආචාර ධර්ම තුළ දැක්වේ. නමුත් ඔක්තෝබර් 13 දින දිවයින පුවත්පත තුළ "හොරට කහ කුඩු හැදූ දෙදෙනෙක් බඩුත් එක්ක දැලේ" යන සිරස්තලයෙන් යුතු පුවත් වාර්තාවේ අන්තර්ගතය තුළ සඳහන් වන්නේ "අන්‍යආගමිකයින් [sic] දෙදෙනෙකු" මෙහිදී අත්අඩංගුවට ගෙන ඇති බවයි.

මෙහිදී සෘජුවම යම් කිසි ආගමිකත්වයක් පුවත් වාර්තාව තුළ ඉස්මතු වී නොමැති නමුත්, සැකකරුවන් 'අන්‍යාගමිකයන්' වීම ප්‍රවෘත්තියට අදාළ වන්නේ කෙසේද? සැකකරුවන්ගේ 'අන්‍යාගමිකත්වය' පුවතට අදාළ වීමේ පදනමක් නොමැති නම්, ඒ අනුව මෙම පුවත් වාර්තාව ඉහතින් දැක්වූ මාධ්‍ය ආචාර ධර්මය උල්ලංඝනය කරනා බව අපි අවධාරණය කරමු.

**#MediaEthicsSL #lka #SinhalaPress #Diivaina**